# මගේ තොප්පිය



පවනි නිහංසා රත්නායක

කෘතියේ නම : මගේ තොප්පිය

කතෘගේ නම : පවනි නිහංසා රත්නායක

කතෘ අයිතිය : පවනි නිහංසා රත්නායක

කතෘගේ වෙනත් කෘති : නොමැත

කෘතිය පළ කරන දිනය : 2025-02-08

ISBN අංකය : ISBN 978-624-208-210-3

# පිදුම

මේ පොත ලියන්නට,

මා දිරිගන්වන ලද

මගේ ආදරණීය දෙමව්පියන්ටත් .....

මගේ ආදරණීය ගුරුතුමිය වන

ගයාත්‍රී සෙනවිරත්න මහත්මියටත්

සෙනෙහසින් පුද කර සිටිමි.

# පෙරවදන

සාහිත්‍යය දියුණුව රටක සංවර්ධනය මනින මිනුම් දණ්ඩකි ලක් ඉතිහාසයේ කෝට්ටේ, දඹදෙණි යුග කැපීපෙනෙන්නේ ද සාහිත්‍යමය වශයෙන් ප්‍රබෝධවත් කාලපරිච්ඡේද නිසාය. එසේ නම් මහාමායා ඉතිහාසයේ ද සාහිත්‍යමය වශයෙන් ස්වර්ණමය අවධිය මෙයයි. දැනට වසර ගණනාවක සිට අපගේ දියණියන් ග්‍රන්ථකරණය තුළින් විස්කම් පෑම එයට හේතුවයි. පාසල තුළ පොත් ලියන සංස්කෘතියක් ගොඩ නගා එය රටේම පාසල් පද්ධතියට ව්‍යාප්තකර මෙවර ගෝලීය ශිෂ්‍ය ප්‍රජාවම ඊට සම්බන්ධ කරගැනීමට අප ගත්කතුවරියන් සමත්වීම සුවිශේෂ සිදුවීමකි.

ඉන් ඔබ්බට යමින් මෙවර පාසල් ප්‍රජාවම ආදි කතෘ කරඳන අත්ථදස්සි මාහිමිපාණන් වහන්සේට උපහාර පිණිස අතීත යතිවර ලේඛක සම්ප්‍රදාය රට තුළ යළි ගොඩනගන්නට පිරිවෙන් ශිෂ්‍ය භික්ෂුන් වහන්සේලා ද ග්‍රන්ථකරණයට යොමුකරන හෙරණගත්කරණී ව්‍යාපෘතිය හඳුන්වා දෙන්නට විය.

මෙම ශාස්ත්‍රිය සහ ශාසනික සේවාවෙන් රටේ පාසල් අධ්‍යාපනයේ සහ පිරිවෙන් අධ්‍යාපනයේ ගුණාත්මක වෙනසක් ඇතිකරන්නට නායකත්වය දීමට ලැබීම එහි විදුහල්පතිනිය වශයෙන් මා හට අභිමානයක් වන අතරම පාසලක් වශයෙන් ලබන ජයග්‍රහණයක් ද වෙයි. ජීවිතයේ මුල් අවධියේම තම සහජ කුසලතාව හඳුනාගනිමින් ලේඛන කරණයට යොමුවීමේ ප්‍රතිඵලයක් ලෙස එළිදකින මෙම කෘතිය ඉදිරි අධ්‍යාපනය සඳහා මෙන්ම අනාගත දිවිය සදහා අත්වැලක් වනු නො අනුමානය.

විදුහල්පතිනිය,
ශශිකලා සේනාධීර,
මහාමායා බාලිකා විද්‍යාලය - මහනුවර.



මගේ උපන් දිනයට ගොඩක් තෑගි ලැබුණා. ඒවා තමා බෝල, පැන්සල්, කතන්දර පොත්.



අම්මා මට දුන්නේ රෝස පාට තොප්පියක්. ඒ තොප්පියේ දිළිසෙන පබළු අල්ලලා තියෙනවා. තොප්පියේ රතු පාට බෝ එකක් තියෙනවා.




මම ඒ තොප්පියට හරි ආසයි. මම තොප්පියට ආස නිසා රාක්කයේ උඩම තට්ටුවේ තිබ්බා.



මගේ මල්ලි චූටියි. එක දවසක් මල්ලි මේසයක් උඩ නැගලා රාක්කයේ උඩ තිබුණ තොප්පිය අරගෙන. මල්ලි චූටි කතුරකින් කපන්න ගියා. එදා නම් මම හොඳටම බය වුණා. එදා නම් මම තොප්පිය බේරා ගත්තේ බොහොම අමාරුවෙන්.



මම තොප්පිය දාගෙන සෙල්ලම් කරන්න ගියා. යාළුවෝ මගේ තොප්පිය හරිම ලස්සනයි කිවුවා. මට හරිම සතුටු හිතුණා.



මම සෙල්ලම් කරද්දි වැටෙයි කියලා තොප්පිය බංකුව උඩින් තිබ්බා. අපි හවස් වෙනකන් සෙල්ලම් කළා. ගෙදර එන්න යද්දි බංකුව උඩ තොප්පිය තිබ්බේ නැහැ.



මම තොප්පිය හැම  තැනම හෙව්වා. මම බංකුව යට, පඳුරු අස්සේ, හැම තැනම බැලුවා. ඒත් තිබ්බේ නැහැ.



මම පිට්ටනියේ තිබුණු අඹ ගහ ගාවට ගියා. මගේ රෝස පාට තොප්පිය තිබුණේ ගහ උඩ.



මම තාත්තාට තොප්පිය ගන්න කිවුවා. ඒක ඇතුළේ කුරුල්ලෙක් බිත්තර දාලා, තාත්තා කිවුවා. මට හරිම සතුටුයි.



මම කුරුළු පැටව් එනකන් බලාගෙන හිටියා. එක දවසක් කිචි බිචි ශබ්දයක් ආවා. බිත්තරවලින් චූටි පැටවු ඇවිත්. මට තොප්පි කුරුළු කූඩුව ගැන හරි සතුටුයි.

# පසුවදන



රටේ අනාගත සංවර්ධනයට ඉවහල්වන සාහිත්‍යය ප්‍රබෝධයත් අධ්‍යාපනයේ ගුණාත්මක දියුණුවත් සාහිත්‍ය නිර්මාණකරණය විභවතා කොටගත් අනාගත පරපුරේ හැකියාවන් ඔප්නැංවීම සහ එළිදැක්වීමට වේදිකාවක් ගොඩ නැගීම වැනි බහුවිධ පරමාර්ථ ඇතිව 2014 වසරේ පටන් මාගේ සංකල්පයකට අනුව ක්‍රියාත්මක පාසල් දරුවන් ග්‍රන්ථකරණයට යොමුකරන ක්‍රියාමූලික පර්යේෂණ ව්‍යාපෘතිය යටතේ මේ වන විට ලේඛක අංකුර හැට දහසකට වැඩි ප්‍රමාණයක් දේශීය සාහිත්‍ය කෙතේ රෝපණය කිරීමට ලැබීම අප ලැබූ භාග්‍යයකි. එම බීජ දළුලා වැඩෙන්නට අවැසි සරු පසක් සැකසීම සමාජ වගකීමයි. පාසලක් මුල්වීමෙන් අධ්‍යාපනයේ ඵලදායිතාව වෙනුවෙන් වසර ගණනාවක් අඛණ්ඩව පාසල් කලාප, පළාත්, ජාතික සහ ජාත්‍යන්තර තලය දක්වා ක්‍රියාත්මක කර ඇති මෑත ඉතිහාසයේ එකම ව්‍යාපෘතිය මෙයයි.

මෙවර ඒ සඳහා පිරිවෙන් ශිෂ්‍ය භික්ෂූන් වහන්සේලා ද සම්බන්ධ කර ගැනීම විශේෂත්වයකි. මෙහිදී මහාමායා බාලිකා විද්‍යාලයේ විදුහල්පති තුමිය, දියණියන්, ගුරුභවතුන්, දෙමාපියන් සහ ආදි ශිෂ්‍යාවන් දැක්වූ කැප කිරීමට ජාතියේ ප්‍රණාමය හිමිවිය යුතුය.

මුද්‍රිත පොත තවමත් අපේ අධ්‍යාපනයේ ප්‍රධාන මෙවලමයි. පොතකින් දරුවෙකුට ලැබෙන ආස්වාදය අන් කිසිවකින්වත් ලබාදිය නොහැකිය. මානව දැනුම ගබඩාකර තැබීමට විවිධ විද්‍යුත් උපාංග භාවිතයට එක්වීමත් සමඟ දරුවන් එයින් දුරස්වීම අධ්‍යාපනයේ ගුණාත්මක බවට අනර්ථකාරී මෙන්ම සමාජය තුළ විවිධ ගැටලු ප්‍රශ්න නිර්මාණය වීමට හේතු වී ඇති බව පර්යේෂණාත්මක ව සනාථ වෙයි. මෙයට පිළියම් වශයෙන් ක්‍රියාත්මක මෙම ව්‍යාපෘතියෙන් වසර ගණනාවක් මුද්‍රිත පොත් රචනාකර ඩිජිටල් තාක්ෂණය යුගයේ ස්මාර්ට් බාල පරම්පරාව නූතන තාකෂණය සමග ගළපමින් දැනට වසර දෙකක සිට රටේම පාසල් දරුවන් සමග එක්ව විද්‍යුත් කෘති රචනාකරයි. තම නිර්මාණ ජාත්‍යන්තර පාඨකයන් වෙත ගෙනයාමට මහාමායා බාලිකාවයන් ඩිජිටල් වේදිකාවක් ගොඩනගා දී තිබේ තම නිසඟ, සාහිත්‍ය නිර්මාණ හැකියාව තුළින් එයට පිවිසි පුංචි ගත්කතුවර ඔබගේ ලේඛන දිවියට මගේ සුභාෂිංසන.

ව්‍යාපෘති නිර්මාතෘ සම්බන්ධීකාරක,
සෙනෙවිරත්න මහලේකම්